**එකිනෙකා සමග සම්බන්ධ වුණ සමාජයක්**

# මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණු ආධාරක

## මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පිළිබඳ ජනතාව පුහුණු කිරීමට මගපෙන්වීමක්



Copyright © 2017 GSM Association

# 3 වන මොඩියුලය - යූටියුබ් (YouTube)

# Bitesize Training

## ඒ කුමක්ද?

**ෆෝන්-එකෙන් යූටියුබ් (YouTube) පෙන්වන්න**

"YouTube-එකෙන් ඔබට ටීවී-එකෙන් වගේ වීඩියෝ බලන්න පුළුවන්. ඒත්, ඔබට තෝරගන්න ඊට වඩා වීඩියෝ විශාල සංඛ්‍යාවක් මෙහි තියනවා. ඔබ බලන වීඩියෝ-එක වගේම, බලන වෙලාවත් තීරණය කරන්නේ ඔබමයි."

"ඔබට බැලීමට කැමති මොන වගේ වීඩියෝ ද කියලා ඔබට YouTube එකේ සෙවුම් කොටසේ ටයිප් කරන්න පුළුවන්. විවිධ රටවල විවිධ අය විසින් දමා ඇති වීඩියෝ අතරින් ඔබ සොයන ආකාරයේ වීඩියෝ ලැයිස්තුවක් ලැබේවි. ඔබ කැමති වෙලාවක, කැමති තැනක ඉඳන් මේ වීඩියෝ බලන්න පුළුවන්"

## ඔබට ඕනෑවෙන්නේ මේවාය.



ස්මාර්ට්ෆෝන්-එක




YouTube පෝස්ටරය

## එය යොදාගත හැක්කේ කුමක් සඳහාද?

"ඔබට, චිත්‍රපට, සින්දු, ප්‍රවෘත්ති, ක්‍රීඩා, කෑම වට්ටෝරු, අධ්‍යාපනික ආදී විවිධ වර්ගවල වීඩියෝ විශාල ගණනක් බැලිය හැකියි. මීට අමතරව 'යමක් කරන්නේ කොහොමදැයි' පැහැදිලි කරන වීඩියෝ ද විශාල ප්‍රමාණයක් ඇත. **උදා:** යම් භාෂාවක් ඉගෙන ගන්නේ කොහොමද? නටන්න පටන් ගන්නේ කොහොමද? යම් කෑමක් උයන්නේ කොහොමද? බයිසිකලයේ ටයරයක හුළං බැස ඇතිවිට, එය සකස් කරගන්නේ කෙසේද..."

"ඔබට, ඔබේම වීඩියෝ පටිගත කර අන් අයට බැලීමට YouTube තුළට මුදාහැරිය හැකියි."."

පුහුණුකරුවාට YouTubeහි ප්‍රතිලාභ ගැන තමන්ගේම **අත්දැකීම් බෙදාහදා ගන්නත්**, ඒවා යොදාගත්තේ කුමටද යන්නත් පැහැදිලි කරන්න පුළුවන්.

**පුහුණුවන්නාට එය අදාළ කරන්න** : පුහුණුවන්නාට ඔහු/ඇයගේ පෞද්ගලික ජීවිතයේ දී YouTube ප්‍රයෝජනවත් වෙන්නේ කෙසේදැයි අදාළ කර පෙන්වන්න.

# එය ක්‍රියාත්මක වෙන්නේ කෙසේද?

ෆෝන්-එක පුහුණුවන්නා අතට දී, මෙම පියවරවලට යාමට උදව්කරන්න




**පෝස්ටරය පෙන්වා,**
සරල වීඩියෝ සෙවුමක් කරන ආකාරය පියවරෙන් පියවර පැහැදිලි කරන්න. (උදා: ජනප්‍රිය දේශීය ගීතයක් සොයන ආකාරය පෙන්වා දෙන්න)

“මයික්‍රොෆෝනය මගින් ‘හඬ සෙවුම්‘(voice searches) කළහැකිය. එවිට, වචන කිසිවක් ටයිප් කිරීමට සිදු නොවේ.”

**මයික්‍රොෆෝනය විදහා දක්වන්න** :
එය ඇත්තේ කොතනද, භාවිතා කරන්නේ කෙසේද යන්න.

# පුහුණුවෙන්න!

‘‘දැන් ඔබ YouTube ගැන දන්නවා, එය මොන වගේ දේවලට භාවිතාකිරීමට ද, ඔබ කැමති?”

පුහුණුකරුවාට ඔවුන්ගේ කැමැත්ත පරිදි සෙවීම සඳහා, ‘සෙවුම් වචන’ (keywords) ලබාදෙන්න. (මෙම සෙවීම සරලව තබාගැනීමට, වචන **1-2** ප්‍රමාණයේ සෙවුම් පමණක් ලබාදෙන්න).

**ඉඟිය** : වීඩියෝ බැලීමට YouTube ඉතා හොඳ වුණත්, ඉන්ටනෙට් ජාලය YouTubeවලට වඩා ඉතා විශාල ය! ඊට වඩා අතිවිශාල තොරතුරු ප්‍රමාණයක් ඉන්ටනෙට් හි තිබේ. ඔබට මුළු ඉන්ටනෙට් එකෙන්ම යමක් සෙවීමට අවශ්‍ය නම්, ‘Google Search’ භාවිතා කළහැකිය.

**පැහැදිලි කරන්න**: වීඩියෝ අප්ලෝඩ් කිරීමටත් - බැලීමටත් හැකි YouTubeවලට සමාන තවත් සේවා ඉන්ටනෙට් හි ඇත. Daily Motion හා Vimeo එවැනි සේවාවන් ය.

# පෝස්ටර්,

# කටවුට් සහ

# තොරතුරු පත්‍රිකා

Icon Cutouts - YouTube



Icon Cutouts - YouTube





# YouTube භාවිතා කරන්නේ කෙසේද?

1 → 2 → 3 → 4 → 5





# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී

දිනය

අත්සන් කරන ලදී



# සහතිකය

**මූලික මොබයිල් ඉන්ටනෙට් කුසලතා පුහුණුව**

සම්පූර්ණ කරන ලදී



දිනය

අත්සන් කරන ලදී